# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2340/18 - 2023 ජූලි මස 11 වැනි අඟහරුවාදා - 2023.07.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි**

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

යොමු අංකය : කඩු/ඉඩම්/01/143/ඩබ්එස්.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශ්‍යතාව රජය වෙත පැවරී ඇති බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*රජයට පැවරී ඇති ඉඩමේ/පරවශ්‍යතාවේ විස්තර* :

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 494/බී අරංගල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, හෝකන්දර උතුර ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කර ඇති මූ. පි. කො. 9999 හා 2022.10.28 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 01 වශයෙන් පෙන්නුම් කරන පහත විස්තර කෙරෙන ඉඩම් කැබැල්ල :

01. **කැබලි අංක 01**

ඉඩමේ නම : නාගහවත්ත *නොහොත්* දඹුගහවත්ත; ඉඩමේ පරිහරණය: ගෙවත්ත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන්නා: බන්දුල ප්‍රියංකර පෙරේරා මයා; ප්‍රමාණය: හෙක්ටයාර් 0.1546.

ඉහත සඳහන් ඉඩමට/පරවශ්‍යතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2023.07.24 වැනි දින පෙ.ව. 10.00ට කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද, 2023.07.17 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශ්‍යතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය. හිමිකම් පෑමට සහාය වන සියළුම ඔප්පු හා ලියවිලි පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

**එච්. එස්. සම්පත් ඉඩම්ගොඩගේ,**
ප්‍රාදේශීය ලේකම්,
කඩුවෙල.

2023 ජූනි මස 30 වැනි දින,
කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 07-0072